සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

# පෙරදිග අපරදිග වශයෙන් සංගීතයේ ස්වභාවය

- **පෙරදිග සංගීතය** හා **අපරදිග සංගීතය** වශයෙන් ලෝක සංගීතය ප්‍රධාන කොටස් දෙකකට බෙදනු ලබයි.
- අපරදිග සංගීතය **බටහිර සංගීතය** ලෙසින්ද හඳුන්වනු ලබයි.

**<u>පහත වගුව කියවා පෙරදිග හා අපරදිග සංගීතයේ ඇති වෙනස්කම් හඳුනාගන්න.</u>**

| පෙරදිග සංගීතය | අපරදිග සංගීතය |
|---|---|
| ඉන්දියාව පදනම් කරගනිමින් ලෝකයේ ව්‍යාප්ත වී ඇති අතර පකිස්ථානය,නේපාලය,ශ්‍රී ලංකාව යන රටවල බහුලව ව්‍යාප්තව ඇත. | එංගලන්තය,ජර්මනිය,ප්‍රංශය,ඇමරිකාව වැනි රටවල ව්‍යාප්තව ඇත. |
| ගායනයකදී හෝ වාදනයක **එකවරකදී** යොදාන්නේ එක් ස්වරයක් පමණි. එය Melody ලෙස හඳුන්වනු ලබයි. | ගායනයකදී හෝ වාදනයක හෝ **එකවරකදී** ස්වර කිහිපයක් එකවිට යොදාගැනේ. එය Harmony ලෙස හඳුන්වනු ලබයි |
| **ඒකල** ගායන වාදනවලට සුවිශේෂ වේ. | **සමූහ** ගායන වාදනවලට සුවිශේෂ වේ. |
| සාමාන්‍ය ප්‍රස්තාර ක්‍රමයක් ඇත. | ඉතා දියුණු ප්‍රස්තාර ක්‍රමයක් ඇත. |
| සීමිත සප්තක ප්‍රමාණයක් යොදාගනී. | වැඩි සප්තක ප්‍රමාණයක් යොදාගනු ලබයි. |

පෙරදිග සංගීතයේ ප්‍රධානම රට ඉන්දියාවයි. ඉන්දියාව **භාරතය** ලෙසද හඳුන්වනු ලබයි. එබැවින් මෙම භාරතීය සංගීතය නැවත ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය.

- උතුරු ඉන්දීය සංගීතය (හින්දුස්ථානි සංගීතය)
- දකුණු ඉන්දීය සංගීතය (කර්ණාටක සංගීතය)



- බ්‍රිතාන්‍ය පාලන අවසන් සමයේදී ඉන්දියාවෙන් මෙරටට පැමිණි **නූර්ති** නමින් හැඳින්වූ නාට්‍යවල ඇතුළත් වූ ගීත හින්දුස්ථානි රාගධාරී සංගීතය ආශ්‍රයෙන් ගොඩනැගුනු අතර මෙම නූර්ති ගීත සාමාන්‍ය ජනයා අතර ජනප්‍රිය විය.
- **1934** වර්ෂයේදී **රවීන්ද්‍රනාත් තාගෝර් තුමන්** ගේ ලංකා ගමනයෙන් පසු හොරණ ශ්‍රීපාලි විද්‍යායතනය මුල්කරගනිමින් හින්දුස්ථානී සංගීතය අධ්‍යාපනය ලැබීම මෙරට ආරම්භ විය.එමෙන්ම ශ්‍රී ලාංකිකයන් හට ඉන්දියාවේ ශාන්ති නිකේතනයට(විශ්ව භාරතී විශ්වවිද්‍යාලය) හා ලක්නව් හි භාත්ඛන්ඩේ විද්‍යාපීඨයට ගොස් වැඩිදුර අධ්‍යාපනය ලැබීම සඳහා අවස්ථාව උදාවිය.
- ග්‍රැමෆෝන් ගී හා ගුවන් විදුලි ගීත සඳහාද වැඩි වශයෙන් හින්දුස්ථානී සංගීත ආභාසය ලබා ඇති අතර බටහිර සංගීතයේ සාමාන්‍ය කොටස් ද මිශ්‍රව භාවිතා කර ඇත.
- ශ්‍රී ලාංකීය නූතන සරල ගීතය සඳහා හින්දුස්ථානී රාගධාරී සංගීතයත් බටහිර සංගීතයත් යන අංශ දෙකෙහිම ආභාසය ලැබී ඇත.

## පැවරුම්

**ඉහත කරුණු හොඳින් කියවා පහත දැක්වෙන හිස්තැන් පුරවන්න.**

1. ලෝක සංගීතය ප්‍රධාන කොටස් ......... කට බෙදිය හැකිය.
2. අපරදිග සංගීතය............................ලෙසද හඳුන්වයි.
3. බටහිර සංගීතයේ දී ...................... සිද්ධාන්තය පදනම් කරගනිමින් ගායන වාදන ඉදිරිපත්කරනු ලබයි.
4. ඒකල ගායන වාදන මූලික කරගත් සංගීතය වන්නේ ...................................... සංගීතයයි.
5. ඉන්දියානු සංගීතය, .............................සංගීතය හා............................... සංගීතය ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය.
6. ....................... නාට්‍ය යනු තබ්ලාව,සර්පිනාව වැනි උත්තර භාරතීය සංගීත භාණ්ඩ යොදාගනිමින් හින්දුස්ථානී රාගධාරී සංගීතය පදනම්ව ගීත නිර්මාණය වී ඇති ඉන්දියාවෙන් මෙරටට පැමිණි නාට්‍ය විශේෂයකි.
7. ශාන්ති නිකේතනයේ නිර්මාතෘ ලෙසත්, හොරණ ශ්‍රීපාලි විද්‍යායතනය බිහිකිරීමේලා පුරෝගාමියෙකු ලෙසත්, ඉන්දියානු ජාතික ගීයෙහි නිර්මාතෘ ලෙසත් කටයුතුකළ ඉන්දියානු සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ පුරෝගාමියා වන්නේ.................................................තුමායි.
8. ශ්‍රී ලංකාවේ ග්‍රැමෆෝන් ගී හා ගුවන් විදුලි ගීත සඳහා ද වැඩි වශයෙන් .................... සංගීත ආභාසය ලබා ඇත.

## ක්‍රියාකාරකම්

1. පෙරදිග රටවල් සහ අපරදිග රටවල් ලැයිස්තුවක් සකස්කරන්න.
2. YouTube පිටුවට ගොස් Western Classical Music හා North Indian Classical Music ලෙස පරීක්ෂාකර වීඩියෝ පට නරඹා බටහිර සංගීතය හා උත්තර භාරතීය සංගීතය පිළිබඳව දළ අවබෝධයක් ලබාගන්න.